# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,875 — 1969 ඔක්තෝබර් 9 වැනි සිකුරාද — 1969.10.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස–අධිකරණ

(මෙහි වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 127 |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම් ... | 128 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම් ... ... | 128 |
| මුදල් නඩු පිළිබඳ දන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දන්වීම් ... ... ... | — |


## පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම්

### බස්නාහිර පළාත

### කොළඹ දිස්ත්‍රික් උසාවි නඩුශාලාවේදීය

දෙවුන්දර, ලයිට් හවුස් වීථියේ, "සුගතසිරි" නිවසේ පදිංචි ප්‍රේමරත්න තේනබදූ.........................පැමිණිලිකාරයා.

නොම්මරය 66236/එම් එදිරිව

පය් යාගල [illegible]..........විත්තිකාරයා.

මෙහි පහත සඳහන් දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 6 දින පෙරවරු 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

පහත සඳහන් දේපල වෙන්දේසි කරනු ලබන්නේ රුපියල් තිස්දෙදස් අසූහතයි ශත පණහක් (රු. 32,087.50) ද, 1966.6.9 සිට සම්පූර්ණයෙන් ගෙවන තෙක් එම මුදලට නීත්‍යානුකූල පොලිය, තහනම් කිරීමේ ගාස්තු, පිස්කල් මුර ගාස්තු, මෙම නඩුවේ ගාස්තු, පිස්කල් ගාස්තු සහ පවුන්ඩේජ් ගාස්තු ද අයකර ගැනීමටය.

#### උපලේඛනය

1. රෙපයාර් කිරීමට ඇති ලොකු කල්දේරම් — තුනයි
2. කල්දේරම් කොටස් — එකොලහයි
3. රා අරක්කු දමන වැට් — තිස්හතරයි
4. පිප්ප — විසිතුනයි
5. අල්මාරි — දෙකයි
6. ගලවා දමන ලද මේසය සමග මේස — දහයයි
7. කබඩ් — හතරයි
8. පුටු — පහයි
9. පයිප්ප කෑලි (තඹ සහ යකඩ) — විසි පහයි
10. වතුර ටැන්කි — දෙකයි
11. තෙල් ටැන්කි — එකයි
12. අත්පොම්ප — දෙකයි
13. ටෙස්කොන්රෝල් පෙට්ටි — එකයි
14. රස්ටන් ඇන්ජින් දෙකක්, ලයිට්ඩයිනමෝ මෝටර් එකයි සුවිච් බෝඩ් ඇත. ඇන්ජින් කාමරයේ යන්ත්‍රෝපකරණ අසම්පූර්ණය
15. රෙදි රාක්ක — එකයි
16. දඹ අඹු — එකයි
17. පයිප්ප ගලවන අඹු — එකයි
18. සුන්බුන්
19. සියලුම ගොඩනැගිලි

ස. ද. සි. විතාරණ,
කළුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1969 ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දින,
කළුතර නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේදී ය.

10-438

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# සබරගමු පළාත

## අවිස්සාවේල්ල දිස්ත්‍රික් නඩුශාලාවේදීය

උඩකනුගල පදිංචි, ජේ. එච්. ඇම්. පොඩිමැණිකේ සහ තවත් අය ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය 9695 — එදිරිව

උඩකනුගල පදිංචි, ඇම්. කේ. සරනේලිසා සහ තවත් අය ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ පැමිණිලිකරුවන්ට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ ඔක්තෝබර් මස 31 දින පෙ. ව. 10 පැයට එම ඉඩම්වල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රු. 4,382.57 ක් හා පිස්කල් ගාස්තු අයකර ගැනීම පිණිසයි.

### දේපල විස්තරය

1. සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ උඩකනුවල පිහිටි කටුකෙන්ගහවත්ත කියන ඉඩමට මායිම් උතුරට: අගල සහ හල්ගහහේනවත්ත; නැගෙනහිරට: මැල්ලකොළ ඇලි ඇල; දකුණට: ගම්සභා පාර සහ ඇබිත්ත පදිංචි උන් ඉඩම; බස්නාහිරට: කුඩා ඇල යන මායිම් තුළ පිහිටි අ. 16 ක් පමණ ඉඩමෙන් සහ එහි පිහිටි රබර්, පොල් සහ පළතුරු යනාදිය සියලු දෙයිනුත් නොබෙදු දෙකෙන් එක් පංගුව වේ. (මෙය 1 සිට 6 දක්වා පැමිණිලිකරුවන්ට අයත් ය.)

2. එසේම එම ගම පිහිටි දන්ගහදෙණියෙ කුඹුර කියන ඉඩමට මායිම් උතුරට: දොල පාර; නැගෙනහිරට: පැලඉනිවැටිය සහ ඉන්නියර; දකුණට: දොල පාර; බස්නාහිරට: මැල්ලකොළ ඇලි ඇල යන මායිම් තුළ පිහිටි වී පැල් 6 ක් පමණ වපසරිය ඇති කුඹුරෙන් නොබෙදු දෙකෙන් පංගුව වේ. (මෙය 1 සිට 6 දක්වා පැමිණිලිකරුවන්ට අයත් ය.)

කේ. සී. රිචඩ්,
නියෝජ්‍ය පිස්කල්, අවිස්සාවේල්ල.

වර්ෂ 1969 සැප්තැම්බර් මස 24 දින,
අවිස්සාවේල්ල පිස්කල් කන්තෝරුවේදී ය.

10-335

---

# මධ්‍යම පළාත

## මහනුවර පිස්කල් කන්තෝරුවේදීය

නොම්මර 267, 269, 271, 274, 270, 268, 272, 275 සහ 276 ගඟවට ගම් සභාවේ ආදායම් ඕවර්සියර් ........................ පැමිණිලිකාරයා.

එදිරිව

මහනුවර, සුදුහුම්පොළ පදිංචි පී. තයාගරාජා ........................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ නොවැම්බර් මස 3 දින දවල් 11 පැයට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මහනුවර ගඟවට කෝරළේ නාගරික සීමාව තුළ සුදුහුම්පොළ පිහිටි වරිපනම් අංක 36/17 දරණ ගෙට මායිම්.—උතුරට: මැද ඇල; දකුණට: පී. ජේ. පිල්ලේ මහතාට අයත් රුක්මනී වත්ත නැමැති ඉඩම; නැගෙනහිරට: පී. ජේ. පිල්ලේ මහතාට අයත් වරිපනම් අංක 36/15 දරණ ගෙය සහ වත්ත; බස්නාහිරට: ඇම්. මල්ලගොඩ මහත්මියට අයත් වරිපනම් අංක 36/36 දරණ ගෙය සහ ඉඩම. (ග. උ. සියඹලාගොඩ පහත සඳහන් නඩුවල මුදල් අයකරගැනීම සඳහා)

ග. උ. අංක 267—රු. 235.62, අංක 269—රු. 116.38, අංක 271—රු. 143.52, අංක 272—රු. 56.38, අංක 274—රු. 61.20, 270—රු. 63.84, අංක 268—රු. 63.84, අංක 275—රු. 95.26, අංක 276—රු. 61.20.

ඩබ්ලිව්. ඩබ්ලිව්. වැත්තැව,
ම. ප. පිස්කල් වෙනුවට.

වර්ෂ 1969.9.30 දින,
මහනුවර පිස්කල් කන්තෝරුවේදී ය.

10-396

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපෑල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි